# 6. මිල සහ වැටුප්

## 6.1 මිල

2000 වසර පාරිභෝගික මිල හැසිරීම සම්බන්ධයෙන් අවධානය යොමු වූ වසරක් විය. මෙයට හේතු වූයේ 1998 වසර අගභාගයේ සිට පැවැති මිල උද්ධමනය පහත වැටීමේ නැඹුරුව වෙනස්වීමේ සන්ධිස්ථානයක් 2000 වසරේ දී සනිටුහන් වීමයි. 1999 වසර පුරාමත්, 2000 වසරේ මුල භාගයේත්, මිල හැසිරීම සම්බන්ධයෙන් පැවති යහපත් වාතාවරණය, ලෝක වෙළඳපොළේ තෙල්මිල ඉහළයාම වැනි අහිතකර බාහිර සාධක නිසා, විශේෂයෙන්ම වසරේ අගභාගය තුළ දී වෙනස් විය. පාරිභෝගික භාණ්ඩ රාශියක දේශීය නිෂ්පාදනය ඉහළයාම, පාරිභෝගික භාණ්ඩ පිළිබඳ තොරතුරු හා බෙදහැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමවීම, සහ විචක්ෂණශීලී මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ආදී දේශීය වශයෙන් හිතකර සාධක පැවතුනද, බාහිර සාධක නිසා මිල උද්ධමනයට ඇතිවූ බලපෑම සම්පූර්ණයෙන්ම නිෂේධනය කිරීමට එම සාධක සමත් නොවීය. දේශීය වශයෙන් ද වැටුප් වැඩිවීම් වැනි මිල කෙරෙහි පීඩනය වැඩිකරන සමහර හේතූන් ද ඇතිවිය.

විශේෂයෙන්ම වසරේ දෙවන භාගය තුළ දේශීය මිල ගණන් ඉහළයාමට බලපෑ ප්‍රධානතම බාහිර සාධකය වූයේ ඉහළ යමින් පැවති තෙල්මිල ගණන්ය. 1990 වසරේ ගල්ෆ් යුද්ධයෙන් පසු ලෝක වෙළඳපොළේ බොර තෙල් මිල එහි ඉහළම මට්ටමට ළඟා විය. ලෝක වෙළඳපොළේ ප්‍රධාන ආනයනිත ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ද අයහපත් අතට හැරුණි. 1999 වසරේ දී රුපියල අවප්‍රමාණය වීම නිසා දේශීය මිල මට්ටම් ඉහළයාමට ඇතිවූ බලපෑම, මිල පහළයාම මගින් මැඩපැවැත්වීමට දායක වූ ප්‍රධාන ආනයන ආහාර ද්‍රව්‍ය වන සහල්, තිරිඟුඇට සහ සීනිවල මිල ගණන්, 2000 වසරේ මුල භාගයේ දී ඉහළයාමට පටන්ගත් අතර, වසර අගභාගයේ දී මෙම මිල ඉහළයාම් වඩාත් තීව්‍රවිය. මේ අතර, ගෙවුම් ශේෂයෙහි පැවති විශාල හිඟය නිසා ඇති වූ බලපෑම මත ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 1999 වසරට වඩා වැඩි වේගයකින් විශේෂයෙන්ම 2000 වසරේ දෙවන භාගයේ දී අවප්‍රමාණය විය. 1999 වසරේ පැවති වාර්ෂික අවප්‍රමාණ අනුපාතය වූ සියයට 6 සමඟ සසඳන විට 2000 වසරේ දී වූ වාර්ෂික අවප්‍රමාණයවීම සියයට 10 ක් විය.

6.1 සංඛ්‍යා සටහන
ප්‍රධාන ආනයන භාණ්ඩවල ලෝක
වෙළඳපොළේ මිල ගණන් (ඇ.ඩො.)
1998-2000

| ශීර්ෂය | ඒකකය | 1998 | 1999 | 2000 | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | | | | | 1999 | 2000 |
| සහල් | මෙ.ටො. | 251.2 | 215.8 | 262.3 | -14 | 22 |
| සීනි | " | 290.8 | 221.6 | 251.6 | -24 | 14 |
| තිරිඟු ඇට | " | 144.4 | 129.1 | 137.8 | -11 | 7 |
| පොහොර | " | 140.0 | 123.1 | 142.6 | -12 | 16 |
| බොරතෙල් | බැරලයක් | 13.7 | 19.1 | 28.7 | 40 | 51 |

මූලය : ශ්‍රී ලංකා රේගුව

ආර්ථිකයේ බාහිර අංශය හා සම්බන්ධ මෙම වෙනස්වීම් දේශීය මිල ගණන් කෙරෙහි සෘජුව මෙන්ම වක්‍රව ද විශේෂයෙන්ම වසරේ දෙවන භාගය තුළ බලපෑම් ඇති කළේය. තිරිඟුපිටි, භූමිතෙල් සහ ඩීසල් ආදී ද්‍රව්‍යවල, මිල ගණන් සහනාධාර යටතේ පවත්වාගෙන යෑම නිසා, ඒවායේ පීඩනය, රාජ්‍ය ණය ගැනීම් කෙරෙහි ඇති බලපෑම වඩාත් තීව්‍ර කිරීමට හේතුවිය. මෙම තත්ත්වය වර්ෂය තුළ අවස්ථා කිහිපයක දී එම පාලිත මිලගණන් සංශෝධනය කිරීමට හේතු විය. එල් පී ගෑස් මිල වැඩි කිරීම ද මෙයට තවත් අයහපත් සාධකයක් එක් කළේය. විශේෂයෙන් ම ඩීසල්, ගෑස් සහ ලිහිසි තෙල් ආදී ද්‍රව්‍යවල ඉහළයමින් පැවති මිල ගණන් අනතුරුව ප්‍රවාහණ සේවාවන්, විදුලිය ගාස්තු සහ පිළියෙල කළ ආහාර ඇතුළු ආහාර හා ආහාර නොවන භාණ්ඩ රාශියක මිල ගණන් කීප වතාවකදී ම ඉහළ නැංවීමට හේතුවිය. ඒ අනුව බාහිර සාධක දේශීය මිල මට්ටම් ඉහළ නැංවීමෙහිලා බහුවිධ වූ බලපෑමක් ඇති කළේය.

බොහෝ දේශීය සාධක, මිල ස්ථායිතාවය ඇතිකර ගැනීමෙහිලා හිතකර ලෙස දායක විය. 1999 වසරේ දී පැවති වාර්තාගත වී අස්වැන්නේ ප්‍රතිඵලයෙහි කොටසක් ලෙස, 2000 වසරේ දී වී මිල මෙන්ම සහල් මිල ද පහත වැටුණි. 1999 වසරේ අගභාගයේ දී සහල් ආනයනය සඳහා වූ ආයාත බදු අනුපාතය සියයට 35 සිට සියයට 10 දක්වා අඩුකිරීමේ හේතුවෙන් ආනයනික සහල්වල වැඩිවීමක් ද සිදුවිය. දේශීය නිෂ්පාදනය පහත යෑමක් ඇතිවුවද, ආනයන ඉහළ යාම නිසා ලොකුළූණු සහ වියළිමිරිස් මිල ගණන් ද පහත වැටුණි.

ඵලදාව වැඩි බීජවර්ග භාවිතය සමඟ වැඩිදියුණු කළ නිෂ්පාදන ක්‍රම සහ අනෙකුත් යෙදවුම් සහ වගාකරන භූමිප්‍රමාණය වැඩිවීම නිසා වැඩි ඵලදාවක් ලැබීම තුළින් පොල් සහ සමහර එළවළු වර්ග වැනි බොහෝ පාරිභෝගික ද්‍රව්‍යවල මිල ගණන් ද පහත වැටුණි. නිෂ්පාදිත ප්‍රදේශවල පැවති යහපත් කාලගුණය ද මෙම වර්ධනයට දායක විය. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් මගින් ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානවල පැවති කෘෂිකාර්මික භාණ්ඩවල මිල ගණන් අඛණ්ඩව ප්‍රචාරණය කිරීම විශේෂයෙන් කෘෂිනිෂ්පාදන බෙදහැරීමේ ක්‍රම හා තොරතුරු වර්ධනය කිරීමට දායකවිය. වෙළඳපොළවල් අතර මිලගණන් පිළිබඳ තොරතුරු කලට වේලාවට ලැබෙන නිසා, සමහර සිල්ලර වෙළඳුන් තම අවශ්‍යතාවන් කෙළින්ම ප්‍රධාන වෙළඳපොළ වලදී ලබාගැනීමට පෙළඹීම නිසාත් මෙම නිෂ්පාදන බෙදහැරීමේ ක්‍රියාවලියේ අතරමැදි වෙළඳ ගණුදෙනු අඩුවී තිබේ. මෙම තත්ත්වයන් බොහෝ දුරට සිල්ලර මිල ගණන් ස්ථායීව පැවතීමට සහ නිෂ්පාදන මිල ගණන් අතර වෙනස්කම් අඩුවීමටත් හේතුවී ඇත. කෙසේවුවත් නිෂ්පාදකයන්, සැපයුම වැඩිකාලය තුළවන තියුණු මිල ගණන් අඩුවීම සම්බන්ධව පැමිණිලි කිරීමට නැඹුරුව ඇත. රජය විසින් හඳුන්වා දෙන ලද මිලදී ගැනීමේ වැඩපිළිවෙල නිෂ්පාදකයාට යහපත් මිලක් ලබාදීමෙහිලා සාර්ථක නොවූ බැවින් ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය, අත්හදබැලීමේ පදනම යටතේ 1999 වසරේ දී හඳුන්වා දෙනු ලැබීය. එම ක්‍රමය ජනප්‍රියවීම ඉදිරියේදී

කෘෂිභාණ්ඩවල මිල උච්චාවචනයන් අඩු කිරීමෙහිලා සාර්ථක ප්‍රතිඵල ලබාදෙන බව පෙනේ. මෙම සාධක, ආහාර ද්‍රව්‍ය රාශියක මිල මට්ටම් ඉහළයෑම අඩු කිරීමට දායකවිය. මුල්‍ය ප්‍රසාරණය 1999 වසරේ දී පැවති සියයට 14 ට සාපේක්ෂව 2000 වසරේ දී සියයට 13 දක්වා අඩු කිරීමට හේතු වූ දැඩි මුල්‍ය ප්‍රතිපත්තිය සමස්ථ ඉල්ලුම තුළින් දේශීය මිල මට්ටම් කෙරෙහි ඇතිවිය හැකි බලපෑම අවම කිරීමට දායක විය.

කෙසේ වෙතත්, බාහිර සාධකවලින් පරිබාහිරව දේශීය මිල මට්ටම් ඉහළ නැංවීමට හේතුවූ දේශීය සාධක කිහිපයක්ද විය. අයහපත් කාලගුණ තත්ත්වය නිසා මාළු නිෂ්පාදනයේ වර්ධනයෙහි පසුබෑමක් ඇති විය. විශාල වර්ගයේ මත්ස්‍ය වර්ගවලට ජපානය වැනි රටවලින් ඇති ඉල්ලුම ඉහලයාම නිසා එවැනි මත්ස්‍ය වර්ග දේශීය වෙළඳපොළට ඇති සැපයුම යම් තරමකට අඩු කිරීමට හේතුවිය. 1999 වසරට සාපේක්ෂව 2000 වර්ෂයේ දී ජපානයට අපනයනය කරන ලද මත්ස්‍ය ප්‍රමාණය තුන් ගුණයකින් පමණ වැඩිවී තිබේ. මෙම සාධකවල සමුච්චිත ප්‍රතිඵලයක් ලෙස බොහොමයක් මත්ස්‍ය වර්ගවල මිල ගණන් 2000 වර්ෂයේ දී 1999 වර්ෂයට සාපේක්ෂව ඉහල මට්ටමක පැවතිණි. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේද සේවක වැටුප් වැඩි කිරීම විශේෂයෙන්ම 2000 වසර අගභාගයේ දී සමස්ථ ඉල්ලුම යම් ප්‍රමාණයකින් ඉහළ දැමීමට හේතු විය.

බාහිර සාධක වෙනස්වීම නිසා ඇති වූ බලපෑම, ඒ අනුව ප්‍රධාන පාරිභෝගික භාණ්ඩවල මිල වෙනස්වීම, දේශීය සාධක සහ ඒ හා බැඳුනු සාර්ව ආර්ථික සාධකවල සාමුහික බලපෑම 2000 වසරේ මැයි මාසය තෙක් පැවති උද්ධමන අනුපාතය පහළ වැටීමේ නැඹුරුව වෙනස් කිරීමට හේතු විය. උද්ධමන වේගය මනිනු ලබන නිල මිල දර්ශකය වන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය මගින් මනිනු ලබන උද්ධමන වේගය ජූනි මාසයේ සිට ඉහළ නැගීම ආරම්භ විය. මැයි මාසයේ පැවති අවම උද්ධමන අනුපාතය වූ සියයට 3.4 ට සාපේක්ෂව ජූනි මාසයේ උද්ධමන වේගය සියයට 3.7 ක් විය. උද්ධමනය ඉහළ නැගීමේ මෙම ප්‍රවණතාවය වර්ෂයේ ඉතිරි කාලය පුරාම පැවතිණි. 2000 වසරේ දී කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම සියයට 6.2 ක් වූ අතර, 1999 වර්ෂයේ දී ඊට සමගාමී වැඩිවීම සියයට 4.7 ක් විය. ආහාර, ඉන්ධන හා ආලෝකය සහ විවිධ යන උප දර්ශක 2000 වසරේ ඉහළ උද්ධමන අනුපාතයට දායකවිය. එම උප දර්ශකවලින් සමස්ථ උද්ධමනයට ඇතිකරන ලද දායකත්වය පිළිවෙලින් සියයට 52, සියයට 21 සහ සියයට 26 ක් විය. බලශක්ති මූලාශ්‍රයන්ගේ මිල ගණන් වර්ෂය පුරා වට කිහිපයක දී ප්‍රතිශෝධනය කිරීම ඉන්ධන හා ආලෝකය යන උප දර්ශකයේ දායකත්වය 1999 වසරේ පැවති සියයට 2 සිට 2000 වසරේ දී සියයට 21 දක්වා ඉහල නැගීමට හේතු විය.

කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට වඩා පුළුල් භූගෝලීය ආවරණයක් ඇති විකල්ප මිල දර්ශක දෙකක් වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගණනය කරනු ලබන කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය (කො.දි.පා.මි.ද.) සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ම.කො.පා.මි.ද.), කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය මගින් පෙන්නුම් කළ මිල හැසිරීමට වඩා තරමක වෙනස් හැසිරීමක් පෙන්නුම් කළේය. එමගින් මෙම මිල දර්ශක තුළ ප්‍රධාන පාරිභෝගික ද්‍රව්‍යවලට ඇති සාපේක්ෂ වැදගත්කමේ වෙනස්කම් සහ එම දර්ශක මගින් නියෝජනය වන වෙළඳපොලවල මිල හැසිරීම අතර වෙනස්කම් නිරූපණය විය. විශේෂයෙන්ම කොළඹ නාගරික බල ප්‍රදේශය තුළ වෙළඳපොළ ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන් වල සාමාන්‍ය වැඩිවීම (කො.පා.මි.ද.) වඩා පුළුල් පරාසයක් ආවරණය වන කොළඹ දිස්ත්‍රික්කය තුළ වෙළඳපොලවල සාමාන්‍ය මිල වැඩිවීමට (කො.දි.පා.මි.ද. සහ ම.කො.පා.මි.ද.) වඩා ඉහළ මට්ටමක පැවතිණි. කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකයට අනුව 2000 වසරේ දී වාර්ෂික උද්ධමන අනුපාතය 1999 වසරේ දී වාර්තා වූ සියයට 3.6 ට සමාන විය. මහ කොළඹ පාරිභොගිකයින්ගේ මිල දර්ශකයට අනුව වාර්ෂික උද්ධමන අනුපාතය 1999 වසරේ වූ සියයට 3.8 ට වඩා තරමක අඩු මට්ටමක් පෙන්වමින් සියයට 3.2 ක් විය. කෙසේ නමුත් දර්ශක තුනෙහිම ඉන්ධන හා ආලෝකය යන උප දර්ශකයේ ඉහළ වැඩිවීම් වාර්තා වී ඇත. කො.පා.මි.ද. යේ මෙම උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම 1999 වසරේ වූ සියයට 2 සමඟ සසඳන විට 2000 වසරේ දී සියයට 19 ක් විය. කො.දි.පා.මි.ද. යේ මෙම අනුරූපී වැඩිවීම 1999 වසරේ දී වූ සියයට 0.6 සමඟ සසඳන විට 2000 වසරේ දී සියයට 16 ක් විය. ම.කො.පා.මි.ද. යේ එම වැඩිවීම 1999 වසරේ දී වූ සියයට 1.3 සමඟ සසඳන විට 2000 වසරේ දී සියයට 15 ක් විය.

**6.2 සංඛ්‍යා සටහන**
**වාර්ෂික සාමාන්‍ය මිල වෙනස්වීම (%)**

| වර්ෂය | කො.පා.මි.ද. | ම.කො.පා.මි.ද. | කො.දි.පා.මි.ද. | තො.අ.මි.ද. | ද.ජා.නි.අ. |
|---|---|---|---|---|---|
| 1980 | 26.1 | - | - | 33.7 | 18.2 |
| 1981 | 18.0 | - | - | 17.0 | 20.6 |
| 1982 | 10.8 | - | - | 5.5 | 10.2 |
| 1983 | 14.0 | - | - | 25.0 | 14.7 |
| 1984 | 16.6 | - | - | 25.6 | 17.4 |
| 1985 | 1.5 | - | - | -15.2 | 0.8 |
| 1986 | 8.0 | - | - | -2.9 | 5.5 |
| 1987 | 7.7 | - | - | 13.4 | 6.8 |
| 1988 | 14.0 | - | - | 17.8 | 11.5 |
| 1989 | 11.6 | - | - | 9.0 | 9.7 |
| 1990 | 21.5 | 24.6 | - | 22.2 | 20.0 |
| 1991 | 12.2 | 11.5 | - | 9.2 | 11.2 |
| 1992 | 11.4 | 9.4 | - | 8.8 | 10.0 |
| 1993 | 11.7 | 8.4 | - | 7.6 | 9.5 |
| 1994 | 8.4 | 4.8 | - | 5.0 | 9.4 |
| 1995 | 7.7 | 3.9 | - | 8.8 | 8.4 |
| 1996 | 15.9 | 14.7 | - | 20.5 | 12.2 |
| 1997 | 9.6 | 7.1 | 7.4 | 6.9 | 8.7 |
| 1998 | 9.4 | 6.9 | 7.3 | 6.1 | 8.4 |
| 1999 | 4.7 | 3.8 | 3.6 | -0.3 | 4.4 |
| 2000 | 6.2 | 3.2 | 3.6 | 1.7(අ) | 6.7 |

(අ) තාවකාලික

මූලයන් : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සියළුම ආර්ථික කටයුතු නියෝජනය වන පුළුල් ආවරණයක් ඇති මිල දර්ශකයක් වන දළ ජාතික නිෂ්පාදිත අවධමනකය (ද.ජා.නි.අ.)ට අනුව 1999 වසරේ වූ සියයට 4.4 සමඟ සසඳන විට 2000 වසරේ දී සියයට 6.7 ක උද්ධමන වේගයක් වාර්තා විය.

ප්‍රාථමික වෙළඳපොළේ මිල වෙනස්වීම් මනිනු ලබන තොග අලෙවි මිල දර්ශකයේ මාස 12 ක වල මධ්‍යයනය 1999 වසරේ දී සියයට 0.3 කින් අඩුවීමට එරෙහිව ආනයනිත අන්තර් භාණ්ඩවල මිල වෙනස්වීම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් 2000 වසරේ දී සියයට 1.7 ක වැඩිවීමක් වාර්තා වී ඇත.

## පරිපාලිත භාණ්ඩවල මිල සංශෝධන

රජයේ ප්‍රතිපත්ති මගින් සෘජුව තීරණය කරනු ලබන හෝ වක්‍රාකාරව බලපෑම් කරනු ලබන සමහර මිල ගණන් 2000 වර්ෂය තුළ කිහිප වතාවක් ඉහළ නැංවීමේ ප්‍රතිශෝධනයන්ට භාජනය විය. එබැවින් නිරවද්‍යව නොවුවද, ඒවා පරිපාලිත මිලගණන් ලෙස සලකනු ලැබේ. ලෝක වෙළඳපොළේ මිලගණන් ඉහළ යාමට සහ රුපියල වැඩි ප්‍රමාණයකින් අවප්‍රමාණය වීමට අනුව දේශීය ආර්ථිකයේ හැඩගැස්ම මෙම මිල වැඩිවීම් වලින් පිළිබිඹු විය. මෙම මිල ඉහළයාම් අනතුරුව විවෘත වෙළඳපොළේ භාණ්ඩ හා සේවාවල මිලගණන් කිහිප වතාවක දී ඉහළයාමට හේතුවිය. එසේ මිල ඉහළ ගිය භාණ්ඩ හා සේවා වූයේ ඩීසල්, ලිහිසි තෙල්, භූමිතෙල්, ගෑස්, විදුලිය, කිරිහුපිටි, පාන්, සිගරට්, අරක්කු සහ බස්ගාස්තුය. වසර තුළ දී ඩීසල් මිල අවස්ථාවන් හතරක දී සංශෝධනය කළ අතර, මෙයින් ඇති වූ සමුච්චිත වැඩිවීම සියයට 86 කි. භූමිතෙල් මිල අවස්ථා තුනක දී සංශෝධනය වීමෙන් ඇති වූ වැඩිවීම සියයට 77 කි. සියළුම වර්ගවල ලිහිසි තෙල් මිල ගණන් අවස්ථා තුනක දී සියයට 100 කින් පමණ වැඩිවිය. කිරිහුපිටි සහ පාන් මිල ජූලි මාසය තුළ දී පිළිවෙලින් සියයට 17 කින් සහ සියයට 6 කින් අඩුකළ නමුදු ලෝක වෙළඳපොළේ කිරිහු මිලගණන් වැඩිවීමේ හේතුවෙන් නැවත එම

**6.3 සංඛ්‍යා සටහන**
**1999 සහ 2000 වසර තුළ පරිපාලිතභාණ්ඩවල මිල සංශෝධනයන්**

| ශීර්ෂය | ඒකකය | සංශෝධනයට පෙර මිල | සංශෝධනයට පසු මිල | වෙනස | ප්‍රතිශත වෙනස | සංශෝධිත දිනය |
|---|---|---|---|---|---|---|
| **1999 මිල සංශෝධනයන්** | | | | | | |
| පාන් | ග්‍රෑම් 450(ගෙඩියක්) | 8.25 | 8.00 | -0.25 | -3.0 | 1999/10/18 |
| සිගරට් (ගෝල්ඩ්ලීෆ්) | එකක් | 5.50 | 6.00 | 0.50 | 9.1 | 1999/11/10 |
| එල්.පී.ගෑස් | කි.ග්‍රෑ. 13.0 | 310.00 | 320.00 | 10.00 | 3.2 | 1999/06/15 |
| එල්.පී.ගෑස් | කි.ග්‍රෑ.13.0 | 320.00 | 335.00 | 15.00 | 4.7 | 1999/12/30 |
| කිරිහු පිටි | කි.ග්‍රෑ.1 | 18.95 | 17.95 | -1.00 | -5.3 | 1999/10/18 |
| **2000 මිල සංශෝධනයන්** | | | | | | |
| පාන් | ග්‍රෑම් 450 (ගෙඩියක්) | 8.00 | 7.50 | -0.50 | -6.3 | 2000/07/01 |
| පාන් | ග්‍රෑම් 450 (ගෙඩියක්) | 7.50 | 8.50 | 1.00 | 13.3 | 2000/11/28 |
| බස් ගාස්තු (ලං.ග.ම.) | කාණ්ඩයක් (අ) | 2.00 | 3.00 | 1.00 | 50.0 | 2000/06/17 |
| සිගරට් (ගෝල්ඩ්ලීෆ්) | එකක් | 6.00 | 6.50 | 0.50 | 8.3 | 2000/05/11 |
| සිගරට් (ගෝල්ඩ්ලීෆ්) | එකක් | 6.50 | 7.00 | 0.50 | 7.7 | 2000/11/17 |
| පොල් අරක්කු | මි.ලීටර් 750 | 250.00 | 260.00 | 10.00 | 4.0 | 2000/05/11 |
| පොල් අරක්කු | මි.ලීටර් 750 | 260.00 | 270.00 | 10.00 | 3.9 | 2000/10/19 |
| ඩීසල් | ලීටරයක් | 13.20 | 16.20 | 3.00 | 22.7 | 2000/02/07 |
| ඩීසල් | ලීටරයක් | 16.20 | 19.50 | 3.30 | 20.4 | 2000/12/06 |
| ඩීසල් | ලීටරයක් | 19.50 | 21.50 | 2.00 | 10.3 | 2000/11/16 |
| ඩීසල් | ලීටරයක් | 21.50 | 24.50 | 3.00 | 14.0 | 2000/12/28 |
| විදුලිබලය (ගෘහස්ථ) | (ඒකක 0-30)(අ) | 2.20 | 2.40 | 0.20 | 9.1 | 2000/06/01 |
| ලිහිසි තෙල් 500 තත්පර | ලීටරයක් | 7.80 | 10.80 | 3.00 | 38.5 | 2000/06/12 |
| ලිහිසි තෙල් 500 " | ලීටරයක් | 10.80 | 14.40 | 3.60 | 33.3 | 2000/11/17 |
| ලිහිසි තෙල් 500 " | ලීටරයක් | 14.40 | 15.90 | 1.50 | 10.4 | 2000/12/27 |
| භූමිතෙල් | ලීටරයක් | 10.40 | 15.40 | 5.00 | 48.1 | 2000/02/07 |
| භූමිතෙල් | ලීටරයක් | 15.40 | 17.40 | 2.00 | 13.0 | 2000/11/16 |
| භූමිතෙල් | ලීටරයක් | 17.40 | 18.40 | 1.00 | 5.8 | 2000/12/28 |
| එල්.පී.ගෑස් (ගෘහස්ථ) | කි.ග්‍රෑ.12.5(ආ) | 335.00 | 365.00 | 30.00 | 9.0 | 2000/02/07 |
| එල්.පී.ගෑස් ( " ) | කි.ග්‍රෑ.12.5 | 365.00 | 470.00 | 105.00 | 28.8 | 2000/06/01 |
| එල්.පී.ගෑස් ( " ) | කි.ග්‍රෑ.12.5 | 470.00 | 509.00 | 39.00 | 8.3 | 2000/12/28 |
| එල්.පී.ගෑස් (ආර්ථිකමය) | කි.ග්‍රෑ.37.5 | 1,603.13 | 1,850.87 | 247.74 | 15.5 | 2000/11/15 |
| කිරිහු පිටි | කි.ග්‍රෑ.1 | 17.95 | 14.95 | -3.00 | -16.7 | 2000/07/01 |
| කිරිහු පිටි | කි.ග්‍රෑ.1 | 14.95 | 16.95 | 2.00 | 13.4 | 2000/11/28 |

(අ) පහළම කාණ්ඩය
(ආ) ගෘහස්ථ එල්.පී.ගෑස් සිලින්ඩරයක බර 2000.01.27 දින සිට බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑම් 0.5 කින් අඩුකර ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

භාණ්ඩයන්හි මිල ගණන් නොවැම්බර් මාසය තුළදී සියයට 13 කින් වැඩිකරනු ලැබීය. ගෑස්මිල අවස්ථා තුනකදී සියයට 52 කින් වැඩිකරනු ලැබූ අතර, කර්මාන්ත සඳහා යොදගන්නා ගෑස් මිල සියයට 15 කින් වැඩි කරන ලදී. ඩීසල් සහ ලිහිසි තෙල් මිල ගණන් වැඩි කිරීම තුළින් විදුලිබල ගාස්තු සහ බස්ගාස්තු සංශෝධනය කිරීමට සිදුවිය. මේ අනුව විදුලිබල ගාස්තු සහ බස්ගාස්තු වල සාමාන්‍ය වැඩිවීම පිළිවෙලින් සියයට 6 ක් සහ සියයට 15 ක් විය. අරක්කු සහ සිගරට් මිල වැඩිවීම් පිළිවෙලින් සියයට 8 ක් හා සියයට 17 ක් විය.

පරිපාලිත භාණ්ඩවල මිල ගණන් ඉවත්කර ගණනය කරනු ලැබූ උද්ධමනය 2000 වසරේ දී සියයට 5.7 ක් වූ අතර, 1999 වසරේ අනුරූපී අගය සියයට 4.9 ක් විය. 2000 වසරේ සමස්ථ උද්ධමන අනුපාතිකය වූ සියයට 6.2 ට පරිපාලිත මිල වැඩිවීම් 1.6 ක ප්‍රතිශත අගයකින් දායකවිය. 1999 වසරේ එම දායකවීම සමස්ථ උද්ධමන අනුපාතිකය වූ සියයට 4.7 න් 0.7 ක ප්‍රතිශත අගයක් පමණක් විය. මේ අනුව පිරිවැය ඉහළයෑම් වලට රාජ්‍ය ආයතන එහි මූලික අවස්ථාවල දී අඩු ප්‍රතිචාරයක් දැක්වීම පෙන්නුම් කරයි.

## කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)

2000 වර්ෂයේ කො.පා.මි.ද. යේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම සියයට 6.2 ක් වූ අතර, මෙය 1999 වසරේ දී වාර්තා වූ සියයට 4.7 ට වඩා තරමක වැඩිවීමකි. සමස්ථ මිල දර්ශකයේ ලක්ෂමය පදනම මත වන වෙනස්වීම් 2000 වසරේ දී 1999 වර්ෂයට වඩා සැළකියයුතු අන්දමේ වෙනස් රටාවක් පෙන්වීය. මිල දර්ශකය, යම්කිසි මාසයක සිදුවූ වෙනස්වීම් ඉකුත් වර්ෂයේ අනුරූපී මාසය සමඟ සැසඳීමෙන් ලක්ෂමය පදනම මත වෙනස්වීම් මනිනු ලබයි. 1999 වර්ෂය සමඟ සැසඳීමේ දී 2000 වර්ෂය තුළ එහි වැඩිවීම්, විශේෂයෙන්ම වර්ෂයේ දෙවන භාගය තුළ දී සාපේක්ෂව වැඩි මට්ටමක විය. 1999 වසරේ ලක්ෂමය පදනම මත ඉහළම වැඩිවීම වූ සියයට 7.7 අප්‍රේල් මාසය තුළ වාර්තාවිය. වසර 2000 තුළ දී ලක්ෂමය පදනම මත උපරිම වැඩිවීම වූ සියයට 10.8 දෙසැම්බර් මාසයේ දී වූ අතර, දෙවැනි ඉහළතම වැඩිවීම වූ සියයට 10.1 ජූලි මාසය තුළ දී සිදුවිය. 2000 වසර තුළ වූ මෙම ඉහළයාම්, ඒ මාසය තුළ හා ඊට පෙර මාසයේ දී සිදුකරන ලද පරිපාලිත මිල සංශෝධනයන් සමඟ සම්බන්ධ විය. සමස්ථ භාණ්ඩ පැසෙන් සියයට 62 ක උපරිම දායකත්වයක් දරණ ආහාර උප දර්ශකයෙහි 2000 වර්ෂයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම සියයට 5 ක් වශයෙන් වාර්තා විය. සමහර ආහාර භාණ්ඩවල මිල තියුණු ලෙස ඉහළ ගිය නමුදු ඒවා දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන ආහාර ද්‍රව්‍යවල මිල ගණන් අඩුවීම මගින් තරමක් දුරට සමනය විය. ඉන්ධන හා ආලෝකය උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම පසුගිය වසරේ පැවති සියයට 2 ට සාපේක්ෂව 2000 වසරේ දී සියයට 19 ක් තරම් විය. සමස්ථ භාණ්ඩ පැසෙන් සියයට 4 ක් පමණක් වූ බර තැබීමක් දරණ ඉන්ධන හා ආලෝකය උපදර්ශකය ගැන සැළකීමේදී,

**6.1 රූප සටහන**
**කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය**
**(1952 = 100)**




**6.4 සංඛ්‍යා සටහන**
**කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය**
**(1952 = 100)**

| ශීර්ෂය | භරිත | දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වැඩිවීමේ දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1999 | 2000 | 1999 | 2000 | දෙසැ. / 1999 | දෙසැ. / 2000 | 1999 | 2000 |
| සියළුම ශීර්ෂ | 100.0 | 2,392.1 | 2,539.8 | 4.7 | 6.2 | 4.0 | 10.8 | 100.0 | 100.0 |
| භාණ්ඩ අනුව | | | | | | | | | |
| ආහාර | 61.9 | 2,695.4 | 2,815.8 | 4.0 | 4.5 | 3.5 | 9.7 | 61.9 | 52.3 |
| රෙදිපිළි | 9.4 | 863.3 | 872.9 | 1.3 | 1.1 | 0.6 | 2.7 | 1.0 | 0.6 |
| ඉන්ධන හා ආලෝකය | 4.3 | 3,929.7 | 4,660.9 | 1.5 | 18.6 | 1.6 | 27.4 | 2.3 | 21.1 |
| ගෙවල් කුලී | 5.7 | 109.8 | 109.8 | - | - | - | - | - | - |
| විවිධ | 18.7 | 2,558.1 | 2,802.4 | 10.3 | 9.6 | 7.8 | 10.8 | 34.8 | 26.0 |

මූලය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වර්ෂය තුළදී සමස්ථ මිල වෙනස්වීමෙන් සියයට 21 ක දයකත්වයක් දරීම මෙම අංශය තුළ සැළකියයුතු අන්දමින් මිල ඉහළයාම නිසා සිදුවිය. මෙම කාලය තුළ විවිධ කාණ්ඩයේ උප දර්ශකයෙහි ගමනාගමනය, සිගරට් සහ මත්පැන් වැනි මිල සංශෝධනයන්ට යටත්වූ අංශවලින් සමස්ථ මිල වැඩිවීමට වූ දයකත්වය සියයට 26 කි. සියයට 9 ක බර තැබීමක් ඇති රෙදිපිළි උපදර්ශකයේ දයකත්වය සියයට 1 ක තරමේ සුළු ප්‍රමාණයකි. වඩා නිදහස් වාතාවරණයක් තුළ රෙදිපිළි අංශයේ ඇතිවී තිබෙන දැඩි තරඟකාරිත්වය මෙම අංශයේ මිල මට්ටම් පසුගිය වර්ෂවල දී මෙන්ම මෙම වර්ෂයේ දී සුළු ප්‍රමාණයන්ගෙන් වෙනස් වීමට දයක වී ඇත.

## මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ම.කො.පා.මි.ද.)

කො.පා.මි.ද. ට වඩා පුළුල් භූගෝලීය පරාසයක් ආවරණය වන ම.කො.පා.මි.ද. 2000 වසර තුළ සියයට 3.2 ක වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකයක් වාර්තා කළ අතර, එය 1999 වර්ෂයේ වාර්තා වූ සියයට 4 ට වඩා තරමක අඩුවීමකි. 1999 වර්ෂයේ වාර්තා වූ සියයට 3 ක වැඩිවීම සමඟ සසඳබලන විට ආහාරපාන උප දර්ශකය සියයට 1 ක අඩු අනුපාතිකයකින් වැඩිවී ඇත. මෙම උප දර්ශකය වසර 2000 තුළ සමස්ථ මිල දර්ශකය අඩුවීම කෙරෙහි සැළකියයුතු මට්ටමකින් දයක විණි.

ඉකුත් වර්ෂයේ සියයට 18 ක වැඩිවීම සමඟ සසඳන විට 2000 වසර තුළ මත්පැන්, දුම්කොළ, බුලත් හා පුවක් උප දර්ශකයේ මිල ගණන් සියයට 13 ක අඩු මට්ටමකින් වැඩිවී ඇත. වසර තුළදී රෙදිපිළි හා පාවහන් සහ සනීපාරක්ෂක හා සෞඛ්‍ය සේවා උප දර්ශකවල මිල ගණන් වැඩිවීම අඩු වේගයකින් විය. කෙසේවුවද, ඉන්ධන හා ආලෝකය සහ ප්‍රවාහන හා පණිවිඩ හුවමාරු යන උප දර්ශකවල මිල ගණන් පිළිවෙලින් සියයට 15 කින් සහ සියයට 20 කින් වැඩි වී ඇති අතර, නිවාස උප දර්ශකයේ මිල ගණන් නොවෙනස්ව පැවතුණි.

**6.2 රූප සටහන**
**මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය**
**(ජන-ජූනි 1989 = 100)**




## කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය (කො.දි.පා.මි.ද.)

කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය 2000 වසරේ දී සියයට 3.6 ක වාර්ෂික වැඩිවීමක් පෙන්නුම් කළ අතර, එය 1999 වසරේ දී වාර්තා වූ අනුපාතය ම විය. සමස්ථ දර්ශකයේ සියයට 59 ක පමණ ඉහළ බරතැබීමක් ඇති ආහාර උප දර්ශකයේ මිල ගණන් අඩු වේගයකින් වැඩිවීම සමස්ථ දර්ශකයේ මධ්‍යස්ථ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම සියයට 2 ක් වූ අතර, එය පසුගිය වර්ෂයට වඩා

**6.5 සංඛ්‍යා සටහන**
**මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය**
**(1989 ජනවාරි සිට ජූනි= 100)**

| ශීර්ෂය | භරිත | දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | 1999 | 2000 | 1999 | 2000 | දෙසැ. / 1999 | දෙසැ. / 2000 |
| **සියළුම ශීර්ෂ** | 100.0 | 244.1 | 252.0 | 3.8 | 3.2 | 0.4 | 7.3 |
| භාණ්ඩ අනුව | | | | | | | |
| ආහාර පාන | 69.3 | 257.1 | 260.8 | 2.8 | 1.4 | -1.1 | 6.2 |
| මත්පැන්, දුම්කොළ, බුලත් හා පුවක් | 3.8 | 350.4 | 396.1 | 18.4 | 13.0 | 11.3 | 13.5 |
| ගෙවල්කුලී | 8.9 | 110.1 | 110.2 | 0.1 | 0.1 | 0.1 | 0.2 |
| ඉන්ධන හා ආලෝකය | 5.4 | 244.7 | 280.4 | 1.3 | 14.6 | 1.5 | 21.4 |
| රෙදිපිළි හා පාවහන් | 2.8 | 245.9 | 250.8 | 6.3 | 2.0 | 1.1 | 4.0 |
| සනීපාරක්ෂක හා සෞඛ්‍ය සේවා, ගෘහස්ථ භාණ්ඩ හා සේවා | 4.9 | 258.2 | 266.7 | 6.4 | 3.3 | 4.0 | 3.7 |
| ප්‍රවාහන හා පණිවිඩ හුවමාරු | 2.8 | 204.4 | 246.1 | 4.3 | 20.4 | 11.1 | 22.8 |
| විවිධ | 2.1 | 203.0 | 200.6 | 10.6 | -1.2 | 2.0 | -1.6 |

මූලය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සුළු වශයෙන් අඩු විය. 1999 වසරේ දී සමස්ථ දර්ශකයෙහි වැඩිවීමට ආහාර උප දර්ශකයෙන් වූ සියයට 40 ක දායකත්වය 2000 වසරේ දී සියයට 27.8 ක් විය. 2000 වර්ෂයේ දී මිල වැඩිවීමේ වේගය අඩු වූ අනෙකුත් උප දර්ශක නම් නිවාස, (සියයට 4 සිට සියයට 3 දක්වා) මත්පැන් දුම්කොළ, බුලත් හා පුවක් (සියයට 22 සිට 12 දක්වා) වේ. 1999 වසරේ දී විවිධ උප දර්ශකයේ මිල

6.6 සංඛ්‍යා සටහන

**කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය**

**(1996 මක්. - 1997 සැප්.= 100 )**

| ශීර්ෂය | බරිත | දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වැඩිවීමේ දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1999 | 2000 | 1999 | 2000 | දෙසැ. / 1999 | දෙසැ. / 2000 | 1999 | 2000 |
| **සියළුම ශීර්ෂ** | 100.0 | 113.4 | 117.5 | 3.6 | 3.6 | -0.1 | 8.5 | 100.0 | 100.0 |
| භාණ්ඩ අනුව | | | | | | | | | |
| ආහාරපාන | 58.7 | 113.8 | 115.7 | 2.4 | 1.7 | -3.1 | 8.6 | 39.7 | 27.8 |
| ගෙවල්කුලී | 13.2 | 109.5 | 112.4 | 4.3 | 2.6 | 3.8 | 2.3 | 0.9 | 9.3 |
| ඉන්ධන හා ආලෝකය | 4.9 | 119.4 | 138.3 | 0.6 | 15.8 | 0.3 | 23.8 | 15.2 | 23.0 |
| රෙදිපිළි හා පාවහන් | 6.2 | 106.2 | 108.0 | 1.9 | 1.6 | 2.3 | 3.4 | 3.2 | 2.6 |
| මත්පැන්, දුම්කොළ, බුලත් හා පුවක් | 4.4 | 135.4 | 152.3 | 22.0 | 12.4 | 14.0 | 15.3 | 27.4 | 18.5 |
| සනීපාරක්ෂක සහ සෞඛ්‍ය සේවා | 3.8 | 113.5 | 118.2 | 4.1 | 4.1 | -0.4 | 10.3 | 4.3 | 4.4 |
| අධ්‍යාපනය හා විනෝදය | 2.8 | 104.2 | 106.5 | 1.9 | 2.2 | - | 5.2 | 1.4 | 1.5 |
| ප්‍රවාහන | 3.7 | 103.9 | 118.8 | 3.6 | 14.3 | 10.8 | 13.3 | 3.4 | 13.5 |
| විවිධ | 2.3 | 119.3 | 118.2 | 7.1 | -0.9 | 1.2 | -0.6 | 4.5 | -0.6 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ගණන්වල වැඩිවීම වූ සියයට 7 ක් සමග සසඳන විට 2000 වසරේ දී එය සියයට 1 කින් අඩුවීමට ප්‍රධාන වශයෙන් සබන් සහ පොල්තෙල් මිල ගණන් අඩුවීම හේතුවිය. ඉහත අඩුවේගයෙන් වූ වැඩිවීම්වලට ප්‍රතිවිරුද්ධව යමින් ඉන්ධන හා ආලෝකය සහ ප්‍රවාහන යන උප දර්ශකවල මිල වැඩිවීම් වේගවත් වී ඇති බව වාර්තා විය. ඉන්ධන හා ආලෝකය උප දර්ශකය සමස්ථ දර්ශකයෙන් සියයට 5 ක් නියෝජනය කරන අතර, එහි 1999 වසරේ දී මිල ගණන්වල වූ සියයට 1 ක වැඩිවීම හා සසඳන විට 2000 වසරේ දී වැඩිවීම සියයට 16 ක් විය. ප්‍රවාහන උප දර්ශකයේ 1999 වසරේ වැඩිවීම වූ සියයට 4 සමග සසඳනවිට 2000 වසරේ දී එය සියයට 14 කින් තියුණු ලෙස වැඩි විය.

## තොග අලෙවි මිල දර්ශකය (තො.අ.මි.ද.)

ප්‍රාථමික වෙළඳපොළ මිල හැසිරීම නියෝජනය වන තොග අලෙවි මිල දර්ශකය 1999 වසරේ වූ සියයට 0.3 ක පහත වැටීමට සාපේක්ෂව 2000 වසරේ දී සියයට 1.7 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. දර්ශකයේ සමස්ථ වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායකත්වය දරණ ලද සාධක ලෙස බොරතෙල්, පොහොර, කිරිඟුඇට, වානේ සහ සමහර වර්ගවල ඖෂධ නිෂ්පාදන මිල ගණන් ඉහළ යෑම දැක්විය හැකිය.

අදාළ කාලපරිච්ඡේදය තුළදී සමස්ථ මිල දර්ශකයේ බොහෝ උප දර්ශකවල මිල ගණන් සැලකියයුතු ආකාරයේ වැඩිවීම් වාර්තාවී ඇති අතර, සමහර උප දර්ශකවල මිල ගණන් සුළු අඩුවීම් පෙන්නුම් කර ඇත. මධ්‍යපාන උප දර්ශකයේ මිලගණන් සියයට 6.1 කින් ද, ඉන්ධන හා ආලෝකය සියයට 5.9 කින් ද, විවිධ උප දර්ශකය සියයට 7.5 කින් ද, කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සියයට

**6.3 රූප සටහන**

**කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය**

**(මක්. 1996 - සැප්.1997 = 100)**




12.4 කින් ද, ඛනිජතෙල් නිෂ්පාදන උපදර්ශකය සියයට 21.7 කින් ද වැඩිවී ඇත.

රසායනික හා රසායනික නිෂ්පාදන සහ ප්‍රවාහන උපකරණ යන උප දර්ශකයන්ගේ මිල ගණන් පිළිවෙලින් සියයට 2.5 ක් සහ සියයට 3.5 ක් ලෙස සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. විදුලි උපකරණ හා සැපයුම් උප දර්ශකයේ ද සියයට 0.7 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කර ඇත. මේ අතර, ආහාරපාන, රෙදිපිළි හා පාවහන්, ලෝහ නිෂ්පාදන, ලෝහමය නොවන නිෂ්පාදන සහ යන්ත්‍රෝපකරණ යන උප දර්ශකයන්හි මිල පහත වැටීම් වාර්තා විය.

ආංශික වර්ගීකරණය අනුව දේශීය කාණ්ඩයේ මිල ඉහළයාම 2000 වසරේ දී සියයට 2.8 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ පැවති සියයට 2.9 ක වෙනස්වීමට වඩා අඩුය. ආනයනික කාණ්ඩයේ ඉකුත් වර්ෂයේ සියයට 0.1 ක සුළු පහළයාම සමග සසඳ බැලීමේ දී 2000 වසරේ දී සියයට 12.0 කින් සැළකියයුතු අන්දමින් වැඩි විය. දේශීය හා ආනයනික යන කාණ්ඩයන්ට ප්‍රතිවිරුද්ධව, අපනයන කාණ්ඩයේ මිල ගණන් 1999 වසරේ දී සියයට 4.0 කින්ද, 2000 වසරේ දී සියයට 5.3 කින් ද, පහත බැස ඇත. අවසන් උපයෝජන වර්ගීකරණයට අනුව පාරිභෝගික භාණ්ඩ සියයට 1.1 කින් අඩු වී ඇති අතර, ආයෝජන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ යන දෙවර්ගයේම මිල ගණන් පිළිවෙලින් සියයට 0.6 කින් සහ සියයට 11.8 කින් වැඩි වී ඇත.

## දිස්ත්‍රික්ක උද්ධමන අනුපාත

1999 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුරාධපුර, මාතලේ සහ මාතර යන දිස්ත්‍රික්ක තුනෙහි මිල දර්ශකයන් උපයෝගී කර ගනිමින් ප්‍රාදේශීය පාරිභෝගික මිල ගණන් වෙනස්වීම් ගණනය කිරීමට උත්සාහ දරා ඇත. මෙම මිල දර්ශකයන් තවමත් අත්හද බැලීම් අවස්ථාවේ

**6.7 සංඛ්‍යා සටහන**
**තොග අලෙවි මිල දර්ශකය**
**(1974 = 100)**

| ශීර්ෂය | භරිත | දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | 1999 | 2000 (අ) | 1999 | 2000 (අ) | දෙසැ. / 1999 | දෙසැ. / 2000(අ) |
| **සියළුම ශීර්ෂ** | 100.0 | 1,295.3 | 1,317.2 | -0.3 | 1.7 | -0.5 | 4.8 |
| භාණ්ඩ අනුව | | | | | | | |
| ආහාර පාන | 67.8 | 1,212.4 | 1,187.1 | -0.9 | -2.1 | -1.7 | 1.9 |
| මද්‍යපාන | 2.9 | 1,649.3 | 1,750.1 | 18.0 | 6.1 | 0.2 | 9.7 |
| රෙදිපිළි හා පාවහන් | 4.0 | 634.9 | 632.9 | 0.1 | -0.3 | - | -0.1 |
| කඩදාසි නිෂ්පාදන | 1.4 | 934.3 | 1,050.0 | 2.1 | 12.4 | 1.8 | 18.8 |
| රසායන හා රසායනික නිෂ්පාදන | 5.2 | 807.9 | 828.2 | 4.7 | 2.5 | 1.9 | 3.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 6.4 | 1,528.2 | 1,859.6 | - | 21.7 | - | 35.5 |
| ලෝහ නොවන නිෂ්පාදන | 1.8 | 2,745.1 | 2,762.4 | 3.4 | 0.6 | -3.3 | -4.4 |
| ලෝහ නිෂ්පාදන | 0.9 | 749.1 | 763.3 | -8.2 | 1.9 | -9.0 | 4.8 |
| ප්‍රවාහන උපකරණ | 0.8 | 886.2 | 916.8 | -5.1 | 3.5 | -0.9 | 7.3 |
| විදුලි උපකරණ හා සැපයුම් | 1.0 | 842.5 | 848.6 | 0.5 | 0.7 | -2.3 | 10.4 |
| යන්ත්‍රෝපකරණ | 1.3 | 691.4 | 679.5 | 6.2 | -1.7 | 0.2 | 3.4 |
| ඉන්ධන හා ආලෝකය | 1.8 | 2,693.9 | 2,853.4 | -4.6 | 5.9 | 6.2 | 0.9 |
| විවිධ | 4.8 | 2,500.7 | 2,687.3 | -3.4 | 7.5 | 5.2 | 2.6 |
| ආංශික වර්ගීකරණය 1 | | | | | | | |
| දේශීය ගණය | 50.3 | 1,143.7 | 1,175.9 | 2.9 | 2.8 | -0.2 | 9.7 |
| ආනයන ගණය | 27.2 | 933.1 | 1,044.7 | -0.1 | 12.0 | -1.5 | 20.3 |
| අපනයන ගණය | 22.5 | 2,071.4 | 1,961.3 | -4.0 | -5.3 | -0.3 | -9.4 |
| ආංශික වර්ගීකරණය 11 | | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 75.3 | 1,279.6 | 1,265.9 | -0.1 | -1.1 | -1.1 | 2.5 |
| අන්තර් භාණ්ඩ | 20.5 | 1,309.4 | 1,464.5 | -1.5 | 11.8 | 2.4 | 14.5 |
| ආයෝජන භාණ්ඩ | 4.2 | 1,509.0 | 1,517.9 | 2.4 | 0.6 | -3.6 | -2.5 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**6.4 රූප සටහන**
**තොග අලෙවි මිල දර්ශකය**
**(1974 = 100)**




**6.8 සංඛ්‍යා සටහන**
**දිස්ත්‍රික්ක පාරිභෝගික මිල දර්ශක**
**(1996 ඔක්. - 1997 සැප්. = 100)**

| දිස්ත්‍රික්කය | දර්ශක | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 1998 | 1999 | 2000 | 1999 | 2000 |
| කොළඹ | 109.5 | 113.4 | 117.5 | 3.6 | 3.6 |
| මාතලේ | 107.5 | 112.2 | 113.0 | 4.4 | 0.7 |
| අනුරාධපුරය | 108.9 | 114.8 | 115.4 | 5.4 | 0.5 |
| මාතර | 109.1 | 114.4 | 114.6 | 4.9 | 0.2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**6.9 සංඛ්‍යා සටහන**
**තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිහිපයක සිල්ලර මිල ගණන්**
**(මුළු දිවයින)**

| භාණ්ඩය | ඒකකය | මිල රුපියල් වලින් | | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| | | 1999 | 2000(අ) | 2000(අ) |
| සහල් (තම්බන ලද) | කි.ග්‍රෑ.1 | 26.38 | 23.50 | -10.9 |
| පාන් (ග්‍රෑම් 450) | ගෙඩියක් | 8.28 | 8.15 | -1.6 |
| බිත්තර(සාමාන්‍ය) | එකක් | 4.24 | 4.51 | 6.4 |
| පොල් (මධ්‍යම) | ගෙඩියක් | 10.02 | 7.48 | -25.3 |
| එළවළු | | | | |
| කරවිල | කි.ග්‍රෑ.1 | 32.85 | 34.92 | 6.3 |
| ගෝවා | " | 28.85 | 28.97 | 0.4 |
| කැරට් | " | 39.19 | 41.84 | 6.8 |
| බෝංචි | " | 36.83 | 41.16 | 11.8 |
| ලීක්ස් | " | 34.37 | 35.56 | 3.5 |
| අර්තාපල් | " | 32.46 | 39.82 | 22.7 |
| රතුළූණු(මධ්‍යම) | " | 54.25 | 58.66 | 8.1 |
| වියළි මිරිස් (නො.1) | " | 132.08 | 121.59 | -7.9 |
| මුහුදු මාළු | " | | | |
| කෙළවල්ලා | කි.ග්‍රෑ.1 | 147.73 | 173.69 | 17.6 |
| ගල්මාළු | " | 124.62 | 138.93 | 11.5 |
| හුරුල්ලා | " | 85.20 | 92.26 | 8.3 |
| සාලයා | " | 58.89 | 56.35 | -4.3 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාදේශීය මිල දර්ශක මගින් පෙන්නුම් කර ඇත. තොරතුරු තාක්ෂණය සහ බෙදහැරීමේ ක්‍රමවල වර්ධනයත් සමග ප්‍රාදේශීය සිල්ලර වෙළඳුන් විසින් අතරමැදි වෙළඳුන් මගහැර සෘජුව නිෂ්පාදකයින්ගෙන් විශේෂයෙන්ම කෘෂිනිෂ්පාදන සපයාගැනීමේ ප්‍රවාහන සහ අනෙකුත් වියදම් අවම කර ගැනීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත. මෙය සමහරක් ප්‍රාදේශීය වෙළඳපොළවල මිල ගණන් කොළඹ වෙළඳපොළ මිල ගණන් වලට වඩා පහළ මට්ටමක පැවතීමට හේතුවී ඇත. ප්‍රාදේශීය මිල දර්ශකවල ආහාර කාණ්ඩයේ නියෝජ්‍යතාවය වැඩි නිසා එම දර්ශක කොළඹ කේන්ද්‍රකොටගත් දර්ශකවලට වඩා අඩු උද්ධමන අනුපාතයන් වාර්තා කිරීමට මෙම නැඹුරුව එක් සාධකයක් ලෙස බලපාන්නට ඉඩ ඇත. කෙසේ වුවත් තීරණාත්මක නිගමනවලට පැමිණීමට පෙර මෙම මිල දර්ශක සඳහා මිල තොරතුරු රැස්කිරීම තවදුරටත් දියුණු කළ යුතුව ඇත.

## ප්‍රාදේශීය මිල වෙනස්වීම

විවිධ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල මිල ගණන් වෙනස්වීම් වල පසුගිය වසරවල පැවති රටාව ම මෙම වසරේදී ද දක්නට ලැබිණි. කෘෂිභාණ්ඩ හා සම්බන්ධ තොරතුරු පවතින බැවින් ඒවායේ වෙනස්වීම් පිළිබඳ නිගමනවලට එළඹීමේදී සුපරීක්ෂාකාරී වියයුතුය. කොළඹ කේන්ද්‍ර කොටගත් මිල දර්ශකයන් මගින් විදහා දක්වන වාර්ෂික උද්ධමන අනුපාතයන්ට වඩා අඩු උද්ධමන අනුපාතයන් සම්පාදනය සහ භාණ්ඩ බෙදහැරීමේ ක්‍රමවල වූ වර්ධනය ප්‍රාදේශීය මිල මට්ටම්වල උච්චාවචනය තරමක් දුරට අඩු කිරීමට හේතුවිය. කෙසේවෙතත්, කෘෂිභාණ්ඩ නිෂ්පාදනය කරන සහ නිෂ්පාදනය නොකරන ප්‍රදේශවල වෙළඳපොළවල්

**6.10 සංඛ්‍යා සටහන**
**තෝරාගත් වෙළඳපොළ කිහිපයක තෝරාගත් ආහාර ද්‍රව්‍ය සඳහා**
**2000 වර්ෂය තුළ පැවති සිල්ලර මිලෙහි වාර්ෂික සාමාන්‍යයන් (අ)**

රු./කි.ග්‍රෑ.

| භාණ්ඩය | කොළඹ | මහනුවර | මාතර | අනුරාධපුරය | දඹුල්ල |
|---|---|---|---|---|---|
| සම්බා සහල් | 31.09 | 31.05 | 29.48 | 27.84 | 27.15 |
| කැකුළු සහල් | 27.87 | 25.25 | 22.33 | 24.01 | 24.41 |
| බෝංචි | 44.88 | 40.59 | 39.31 | 39.57 | 38.23 |
| ගෝවා | 30.45 | 25.08 | 25.71 | 28.41 | 27.21 |
| වම්බටු | 35.46 | 26.67 | 21.11 | 20.90 | 24.01 |
| වට්ටක්කා | 24.20 | 25.52 | 20.48 | 18.64 | 17.53 |
| රතු ළූණු | 64.73 | 70.50 | 61.73 | 59.48 | 61.47 |
| ලොකු ළූණු | 31.87 | 34.58 | 31.19 | 33.20 | 32.30 |
| අර්තාපල් (දේශීය) | 30.71 | 32.96 | 30.72 | 32.48 | 31.72 |
| වියළි මිරිස් | 111.78 | 122.86 | 119.25 | 125.78 | 118.04 |
| කෙළවල්ලා | 186.26 | 211.86 | 195.33 | 211.32 | 145.51 |
| හුරුල්ලා | 76.58 | 114.29 | 81.33 | 101.83 | 90.42 |
| බිත්තර (එකක මිල රු.) | 3.81 | 4.07 | 4.52 | 4.14 | 4.26 |
| පොල් (ගෙඩියක මිල රු.) | 10.67 | 10.15 | 8.54 | 8.78 | 8.99 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### 6.11 සංඛ්‍යා සටහන
### තෝරාගත් වෙළඳපොළ කිහිපයක තෝරාගත් ආහාර ද්‍රව්‍ය සඳහා 2000 වර්ෂය තුළ පැවති සාමාන්‍ය මිල ගණන් කොළඹ සහ දඹුල්ල මිල ගණන් වලට සාපේක්ෂව ප්‍රතිශත වෙනස

| භාණ්ඩය | කොළඹට සාපේක්ෂව ප්‍රතිශත වෙනස (අ) | | | | දඹුල්ලට සාපේක්ෂව ප්‍රතිශත වෙනස (අ) | | |
|---|---|---|---|---|---|---|---|
| | මහනුවර | මාතර | අනුරාධපුරය | දඹුල්ල | මහනුවර | මාතර | අනුරාධපුරය |
| සම්බා සහල් | -0.13 | -5.18 | -10.45 | -12.67 | 14.36 | 8.58 | 2.54 |
| කැකුළු සහල් | -9.40 | -19.88 | -13.85 | -12.41 | 3.44 | -8.52 | -1.64 |
| බෝංචි | -9.56 | -12.41 | -11.83 | -14.82 | 6.17 | 2.83 | 3.51 |
| ගෝවා | -17.64 | -15.57 | -6.70 | -10.64 | -7.83 | -5.51 | 4.41 |
| වම්බටු | -24.79 | -40.47 | -41.06 | -32.29 | 11.08 | -12.08 | -12.95 |
| වට්ටක්කා | 5.45 | -15.37 | -22.98 | -27.56 | 45.58 | 16.83 | 6.33 |
| රතු ළූණු | 8.91 | -4.63 | -8.11 | -5.04 | 14.69 | 0.42 | -3.24 |
| ලොකු ළූණු | 8.50 | -2.13 | 4.17 | 1.35 | 7.06 | -3.44 | 2.79 |
| අර්තාපල් (දේශීය) | 7.33 | 0.03 | 5.76 | 3.29 | 3.91 | -3.15 | 2.40 |
| වියළි මිරිස් | 9.91 | 6.68 | 12.52 | 5.60 | 4.08 | 1.03 | 6.56 |
| කෙළවල්ලා | 13.74 | 4.87 | 13.45 | -21.88 | 45.60 | 34.24 | 45.23 |
| හුරුල්ලා | 49.24 | 6.20 | 32.97 | 18.07 | 26.40 | -10.05 | 12.62 |
| බිත්තර (එකක්) | 6.82 | 18.64 | 8.66 | 11.81 | -4.46 | 6.10 | -2.82 |
| පොල් (ගෙඩියක්) | -4.87 | -19.96 | -17.71 | -15.75 | 12.90 | -5.01 | -2.34 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### 6.5 රූප සටහන
### තෝරාගත් භාණ්ඩවල මාසික සාමාන්‍ය මිල - 2000



අතර භාණ්ඩ සැපයුම සහ ගුණාත්මක භාවය සම්බන්ධව පවතින වෙනස පිළිබිඹු කරමින් ඒවා අතර මිල වෙනස්කම් තව දුරටත් දක්නට ලැබුණි. මෙම මිල උච්චාවචනයන් තවදුරටත් අඩු කිරීමට, ඇසුරුම් ප්‍රවාහනය සහ ගබඩා පහසුකම් තවදුරටත් වැඩිදියුණු කළයුතු බව එමගින් පෙන්නුම් කෙරේ. දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානයට සමාන යෝජිත ප්‍රාදේශීය වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවීම මගින් මෙයට විසඳුමක් ලබාදිය හැක.

## 6.2 වැටුප්

ශ්‍රී ලංකා ආර්ථිකයේ සේවා නියුක්තිය සහ වැටුප්, රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකින් යුක්තවේ. පෞද්ගලික අංශය තවදුරටත් සංවිධිත සහ අසංවිධිත වශයෙන් කොටස් දෙකකි. මධ්‍යම රජය, පළාත්පාලන ආයතන, පළාත් සභා සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගෙන් රාජ්‍ය අංශය සංයුක්ත වී ඇත. අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ බුක්ති විඳින සේවකයන්ගෙන් සංවිධිත පෞද්ගලික අංශය සංයුක්ත වන අතර, සීමිත පරිමාණයන් මත ස්වේච්ඡා පදනමක් යටතේ හැර එවැනි විශ්‍රාමික වරප්‍රසාද නොලබන සේවකයන්ගෙන් අසංවිධිත අංශය සමන්විත වේ.

රාජ්‍ය සේවකයන් 2000 වර්ෂය තුළදී නාමික වැටුප් වැඩිවීමකට හිමිකම් පෑ අතර, එම වැඩිවීම විවිධ සේවක කාණ්ඩ සඳහා සියයට 7.4 සහ සියයට 9.4 යන පරාසය තුළ සියයට 6.2 ක වාර්ෂික උද්ධමන අනුපාතයට අනුව විය. එම කාණ්ඩ සඳහා වූ මූර්ත වැටුප් වැඩිවීම් සියයට 1 සහ සියයට 3 ක යන පරාසය තුළ සිදු වී ඇති බව පෙනේ. සංවිධිත පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ද නාමික අවම වැටුප් විවිධ සේවක කාණ්ඩ සඳහා විවිධ අනුපාතයන්ගෙන් වැඩි විය. අවම වැටුප් දර්ශකයේ වෙනස්වීමට අනුව සියළුම සේවකයන් සඳහා වූ නාමික වැටුප් වැඩිවීම සියයට 2 ක් වූ අතර, කෙසේවුවත් එය 2000 වර්ෂය තුළ පැවති සාමාන්‍ය උද්ධමන අනුපාතය වූ සියයට 6.2 ට වඩා අඩු විය. කෘෂිකාර්මික සහ කර්මාන්ත හා වාණිජ යන අංශවල සේවකයන් සඳහා පොදු නාමික වැටුප් වැඩිවීමක් ලැබිණ. කෙසේවෙතත්, සේවා අංශයේ සේවකයන්ගේ වැටුප් වර්ෂය තුළ නොවෙනස්ව පැවතිණි. සංවිධිත පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් වැඩිවීමට ප්‍රතිවිරුද්ධාකාරයෙන් අසංවිධිත අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් වසරේ උද්ධමන අනුපාතයට වඩා වැඩි අනුපාතයකින් වැඩිවීම නිසා මූර්ත වැටුප් වැඩි විය. මෙවැනි වැටුප් වැඩිවීම් සංඛ්‍යා දත්ත ඇති, වී ගොවිතැන, පොල් වගාව, රබර් කිරිකැපීම, තේ දළු නෙලීම සහ ගොඩනැගිලි කර්මාන්තය යන අංශවල දක්නට ලැබුණි.

### රාජ්‍ය අංශය

රාජ්‍ය අංශයේ වැටුප් වෙනස්වීම් පාසැල් ගුරුවරුන් ඇතුළු රාජ්‍ය අංශ වල සේවක කාණ්ඩ තුනක් සඳහා ගණනය කරනු ලබන වැටුප් දර්ශක මගින් නිරීක්ෂණය කරනු ලැබේ. ඉදිරියේදී වැටුප් සංශෝධනයක් කරන තුරු රාජ්‍ය සේවකයන්ට අමතර ගෙවීමක් 2000 වර්ෂයේ අයවැයෙන් ලබාදෙන ලදී. මේ නිසා පාසැල් ගුරුවරුන් හැර මධ්‍යම රජයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 1.9 කින් වැඩි විය. පාසැල් ගුරුවරුන් සඳහා වූ වැඩිවීම සියයට 1 ක් විය. 2000 වසරේ අගෝස්තු මාසයේ 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 12,000 ක් හෝ ඊට අඩු මාසික වේතනයක් ලබන රාජ්‍ය සේවකයන්ට රුපියල් 600 ක අතුරු දීමනාවක් ලබාදෙන ලදී. අනතුරුව 2000 වසරේ ඔක්තෝබර් මාසයේ 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, විශ්‍රාම වැටුපට ඇතුළත් නොවන, අවමය රුපියල් 1000 ක් වන පරිදි සියයට 10 ක වැටුප් වැඩිවීමක් සියළුම රාජ්‍ය සේවකයන්ට ලබාදෙන ලදී. මෙම සියයට 10 යේ දීමනාවට අගෝස්තු මාසයේ ලබා දුන් රුපියල් 600 ද ඇතුළත් කරන ලදී.

6.12 සංඛ්‍යා සටහන

**වැටුප් පරිමාණ දර්ශක අංක**

**(1978 දෙසැම්බර් = 100)**

| සේවක තත්ත්වය | මූල්‍ය | | මූර්ත | | 2000 ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1999 | 2000(අ) | 1999 | 2000(අ) | මූල්‍ය(අ) | මූර්ත(අ) |
| **1. රජයේ සේවකයන්** | | | | | | |
| සියළුම රජයේ සේවකයන් | 1,001.4 | 1,084.7 | 100.2 | 102.1 | 8.3 | 1.9 |
| විධායක නොවන | 959.6 | 1,031.3 | 96.0 | 97.1 | 7.5 | 1.1 |
| සුළු සේවකයන් | 1,029.1 | 1,125.8 | 103.0 | 105.9 | 9.4 | 2.8 |
| රජයේ පාසැල් ගුරුවරුන් | 805.5 | 865.1 | 80.6 | 81.4 | 7.4 | 1.0 |
| **2. පඩි පාලක සභාවලට අයත් කම්කරුවන්** | | | | | | |
| සියළුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | 977.6 | 1,000.4 | 97.8 | 94.3 | 2.3 | -3.6 |
| කෘෂිකර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 1,116.0 | 1,142.7 | 111.7 | 107.7 | 2.4 | -3.6 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලුණු කම්කරුවන් | 829.2 | 857.2 | 83.0 | 80.8 | 3.4 | -2.7 |
| සේවා අංශයන්හි කම්කරුවන් | 559.7 | 559.7 | 56.0 | 52.8 | - | -5.7 |

(අ) තාවකාලික

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## සංවිධිත පෞද්ගලික අංශය

පඩි පාලක සභාවලට අයත් කම්කරුවන් සඳහා වන අවම වැටුප් දර්ශකවල වෙනස්වීම් පදනම් කොටගෙන සංවිධිත පෞද්ගලික අංශයේ වැටුප් වෙනස්වීම් නිරීක්ෂණය කරනු ලැබේ. කෘෂිකර්මය, කර්මාන්ත හා වාණිජ සහ සේවා වැනි විවිධ ආර්ථික කටයුතු පවතින අංශ සඳහා පඩි පාලක සභා පවතී. දනට ක්‍රියාත්මකව පවතින එවැනි පඩි පාලක සභා 34 ක් ඇත. කෘෂිකර්මය කර්මාන්ත හා වාණිජ කටයුතු යන අංශවල සේවකයන් සඳහා මූල්‍ය වැටුප් 2000 වසර තුළදී විවිධ අනුපාතයන්ගෙන් වැඩිකරන ලදී. එම අංශ දෙකට 2000 වසරේ ලබාදුන් වැටුප් වැඩිවීම් පිළිවෙලින් සියයට 2.4 ක් සහ සියයට 3.4 ක් විය. කෙසේ වෙතත්, සේවා අංශයේ අවම වැටුප් වල වෙනසක් සිදු නොවීය. මේ සියල්ලගේම ප්‍රතිඵලයක් ලෙස සමස්ථ අංශයම නියෝජනය වන සංයුක්ත වැටුප් දර්ශකය සියයට 2.3 කින් වැඩි විය. කෙසේ වෙතත්, වාර්ෂික උද්ධමන වේගය, නාමික වැටුප් ඉහළයාමට වඩා වැඩිවූ නිසා (කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ වෙනස්වීම්වලට ගැලපුම් කරණ ලද) මූර්ත වැටුප් දර්ශකය පසුගිය වසර හා සමඟ සැසඳීමේ දී සියයට 3.6 කින් පමණ පහත වැටුණි. මෙම අංශයේ සෑම වැටුප් කාණ්ඩයකම මූර්ත වැටුප් පහළයාමේ නැඹුරුවක් දක්නට ලැබුණි. සේවා අංශයේ සේවකයන්ගේ මූල්‍ය වැටුප් වර්ෂය තුළ නොවෙනස්ව පැවැතීම නිසා අනෙකුත් අංශවල මූර්ත වැටුප් අඩුවීමට වඩා වැඩි අඩුවීමක් මෙම අංශයේ සිදුවිය.

සංවිධිත පෞද්ගලික අංශයේ වැටුප් වෙනස්වීම් අවම වැටුප් දර්ශක මගින් පිළිබිඹු නොකෙරේ. මෙම අංශයේ විශේෂයෙන් වෘත්තීයමය සහ කළමනාකාරිත්ව අංශවල පුහුණු සේවකයන්ට උද්ධමනය නිසා මූර්ත වැටුප් අඩුවීමට සමානුපාතික හිලව් ගෙවීමක් ලබාදෙනු ලැබේ. එසේම ඔවුන්ගේ ඵලදායිතාවය වැඩිවීමට සාපේක්ෂව වැඩි වැටුප් ද ඔවුන් භුක්ති විඳිති. අවම වැටුප් දර්ශකවලට අනුව මෙම අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පහත ගියද, මෙම අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් නොවෙනස්ව පැවතීමට හෝ වැඩිවන්නට ඇත.

## අසංවිධිත පෞද්ගලික අංශය

අසංවිධිත පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් පිළිබඳ තොරතුරු දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩ පිළිවෙල යටතේ එක් රැස් කරනු ලැබේ. මෙම තොරතුරුවලට අනුව මෙම අංශයේ බොහොමයක් සේවකයන්ගේ මූර්ත වැටුප් වැඩිවන ආකාරයට මූල්‍ය වැටුප් විවිධ අනුපාතයන්ගෙන් වැඩි විය. මේ ආකාරයට මූල්‍ය වැටුප් වැඩි වූ පරාසයන් නම් රබර් වගාව (සියයට 11 සිට සියයට 21 දක්වා), වී වගාව (සියයට 8 සිට සියයට 13 දක්වා), තේ වගාව (සියයට 7 සිට සියයට 19 දක්වා), පොල් වගාව (සියයට 7 සිට සියයට 15 දක්වා) සහ ගොඩනැගිලි කර්මාන්තය (සියයට 7 සිට සියයට 11 දක්වා) වශයෙනි. මෙම සියළුම සේවක අංශයන් සඳහා මූර්ත වැටුප් වැඩිවීම් වර්ෂය තුළ වාර්තා විය.

ආරම්භයේදීම සඳහන් කළ පරිදි මෑතකදී කරන ලද වැටුප් වැඩිවීම්, දේශීය ඉල්ලුම තුළින් මිල මට්ටම් ඉහළ දැමීමට බලපෑමක් ඇතිකරන ලදී. සංවිධිත පෞද්ගලික අංශයේ ආයතන ඔවුන්ගේ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ ඵලදායීතාවයට සම්බන්ධ කර තිබුන ද, රාජ්‍ය අංශයේ එවැන්නක් නොපවතී. මේ නිසා රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීම මිල වැඩිවීම යන චක්‍රිය වැඩිවීම්වලට හේතුවේ. ඒ අනුව කුමන අංශයක හෝ මූර්ත වැටුප් වැඩිවීමක් අවසානයේ දී ඵලදායීතාවය හා සම්බන්ධ නොවේ නම් දිගුකාලීනව අනර්ථකාරී වේ.